








මේ එළඹෙන්නේ සිරිපා සමයයි. මෙය මැයි මස වෙසක් පෝයෙන් අවසන් වෙනවා. පුරාණ කල සිට පැවත එන පරිදිඉපැරණි පැල්මඩුල්ලේ ගල්පොත්තාවෙල පන්සලේ තැන්පත් කර තිබෙන සුමන සමන් දෙවියන්ගේ දේව රූපය හා දේවා භරණ පෙරහැරකින් සිරිපා මලුවේ සමන් දේවාලයේ තැන්පත් කිරීමෙන් පසුව සිරිපා සමයේ ආරම්භය සනිටුහන් වෙනවා.මේ පෙරහැර එන අතරමගදී රූපය තැන්පත් රථයට ගම්වැසියන්ගෙන් මෙන්ම අවට ගම්වල ජනතාවගෙන්ද විශේෂ පූජෝපහාර ලැබෙනවා වගේම පිලිගැනීම් උත්සවද සංවිධානය කරතිබෙනවා.

මෙසේ ආරම්භ වන මේ පින්බර වන්දනා සමයේ මුල් බැතිමතන් වන්නේත් මේ ගමේ හා අවට ගම්වල ජනතාවයි. මාර්තු මස උදාවත් සමග කොළඹ හා රටේ අනිකුත් පලාත් වලින් වන්දනා නඩ පැමිණීම ආරම්භ වෙන බව දක්නට ලැබෙනවා. අනාදිමත් කලක සිට අපේ මුතුන් මිත්තන් සිරිපා කරුණා කිරීමට ලක ලෑස්තිවුනේ ඉතාමත් මහන්සියෙන් බවබෝග වගාකර හරියට කුසට නොකා එකතු කරගන්නා මුදල් වලින්. එකල මෙය පා ගමනින් යන ඉතාම වෙහෙසකාරී වූ ගමනක් නිසා තම ජීවිතය ගැනවත් නොතකා මේ අහිංසක පින්වත් මිනිසුන් මගට බහින්නේ තමන් සන්තකයේ තිබෙන දේ දරුවන්ට පවරලා බව මා අසා තිබෙනවා. ඒ වගේම පහසුකම් නොමැතිව හුලු අතු පත්තු කරගෙන පාලු මංමාවත් පසුකරගන හරියට කුසට අහරක් නොමැතිව සිත්වල ශ්‍රද්ධාවෙන් ගිය අපේ පරැණ්නන්ගේ අවංක භක්තියට නපුරු වන සතුන්ගෙන් පවා ලැබුනේ ආශිර්වාදයක්. ඔවුන් ලෙඩ වලින් හා නොයෙකුත් ආපදා වලින් බේරීමටත් ගමන් මහන්සිය නිවා ගැනීමටත් තුන් සරණේ කවි ගායනා කිරීම පුරුද්දක් විදිහට කරගෙන ගිහින් අද දක්වාත් එය නොකඩවාම කරගෙන යන සිරිතක් බවට පත්වෙලා තිබෙනවා.තම ජීවිතයද නොතකා වත්පිලිවෙත් කරමින් අපේ පැරන්නන් අපට රැක දීපු අප ලක් මාතාවගේ වටිනාම සම්පත වූ ඒ උතුම් පූජනීය භූමියට තරුණ පිරිස් කරන හානිය ගැන අසන දකින දේ නම් සැබෑ බෞද්ධයන්ගේ සිත්වලට ඇති කරන්නේ විශාල වේදනාවක්. අද තරුණ පිරිස් තුන් සරණේ කවි විහිලුවකට ලක් කරමින් පාට තොප්පි දාගෙන විනෝද චාරිකාවකට මෙන් නොයෙක් වර්ණයන්ගෙන් සැරසී සුන්දර පරිසරය කසල ගොඩක් බවට පත් කරමින් මෙසේ හැසිරීම සැබවින්ම වේදනාවට කරැණක්. මීට අඩ සියවසකට පමණ පෙර මම සිරිපා කරැණා කරන විට පාසල් යන දැරියක්. ඊට පසුවද පාසලේ ඉහල පන්තිවල ඉගෙනුම ලබන කාලයේදීත් දෙවරක්ම මට සිරිපා වන්දනා කිරීමට වාසනාව ලැබුණ නිසා එම අතීත මතකයන් සිහි කරමින් අදත් මම යම් ආශ්වාදයක් ලබනවා වගේම දුරු රටක පදිංචියට ආ පසුවත් තුන් සරණේ කවි වලට නිතර සවන් දීම තුලින් සිතට සැනසීමක් ලබා ගන්නවා.

මට මතකයි එකල කඨිණ පිංකම් කාලවලදීත් පන්සල් වල තුන් සරණේ කවි නිතරම අහන්න ලැබෙනවා. මම සිරිපාද වන්දනා ගමන් ගිය කාල වකවානුවේ අපේ ගමේ සිටි සැමගේ ගෞරවයට පත් දැනුමෙන් පොහොසත් පුද්ගලයා තමයි නඩේ ගුරා වන්නේ. කලින් දවසේ පන්සල් ගිහින් බාරවෙලා උදේ පාන්දරින්ම නඩේ කට්ටියව පන්සලට රැස් කරවා අවවාද අනුශාසනාවන්ගෙන් පසුවයි ගමන ආරම්භ වන්නේ.

මේ සිරිපා සමයේ සමණල කන්ද තරණය කරන මාර්ග මාර්ග දෙකනම් හැටන් හා රත්නපුර යන මාර්ග දෙක වුවත් කුරැ විට එරත්ත හරහාත් වන්දනා නඩ ගමන් කරනවා. අපේ ගමේ නඩය නම් යන්නේ හැටන් මාර්ගයෙනුයි.මේ ගමන් වලදී සැම කෙනෙකුම ලග සැහැල්ලුවක් තියෙනවා. එය පඩුරු පූජා භාණ්ඩ ඉදිකටු නූල් හා අග්ගලා රස කැවිලි වැනි දෑ අරගෙන යන්න යොදා ගැනෙනවා. ගිමන් නිවා ගැනීමට අතරමගදි පොඩි කඩවල් හා ඒ ඉදිරිපිට බංකු තනා තිබීම තිබීම සෑම වන්දනා නඩයකටම ලොකු පිටුවහලක්. ඒවාගේම තරාතිරම් නොබලා සැමටම උදව් කරමින් සමගියෙන් වන්දනා කරන වැඩිහිටි පරපුරේ එකමුතුකම නම් අගය කල යුතුමයි.

අතරමගදී හමුවන සීත ගගුල ගෙත්තම්පාන ඇහැළ කනුව ලිහිණි හෙල මහගිරිදඹ අහස්ගව්ව මේ සියල්ලක්ම පසුකරන අතර වදින්න යන මේ නඩේට බුද්ධම් සරණේ සරණයි කීමත"ඊට පෙරලාම වැදල බහින මේ නඩේට ධම්මන් සරණේ සරණයි කියන්නත් අමතක කරන්නේ නැහැ . සුදු වතින් සැරසුන බාල තරුණ මහලු කා තුලත් ඇති බැතිබර බව එකල කැපී පෙනෙන්න තිබුන දෙයක්.තුන් සරණේ කවි තාලයකට ගායනා ඒ අවට සිසාරා පැතිරීම කාගේත් සිත් තුල පහන් හැගීම් ඇති කලා. අවට පරිසරය හරිත වර්ණ ශාඛාවන්ගෙන් හා ඈතින් පෙනෙනා කැලෑ රොදවලින් වටවී දකින්න ලැබෙන සුන්දර දසුන් බැතිමතුන්ගේ විඩාව පලවා හැරීමට සමත් අයුරින් පරිසරය විසින්ම ලබාදෙන ආශිර්වාදයක් වගෙයි.

මම ගිය සෑම වරකම අපි ඉර සේවය බැලීමට අමතක කලෙත් නැහැ. ස්වාභාව ධර්මය විසින් මවන රෑරටා සැබවින්ම හරිම අපූරුයි. රෑට අහසේ දීප්තිමත්ව බබලන චන්දුයා වටා ලස්සණ රටා මවමින් හිම තට්ටු ඉහලට නගිමින් සැහැල්ලුවෙන් පාවෙන අන්දමත් චන්දුයාඅවට පරිසරය වලාකල් සලුවකින් වැසීගන ගිහින් නැගෙනහිරින් ඉර උදා වනවිට දකින චමත්කාර දර්ශණය හරිම අලංකාරයි. ඒවගේම ඈතින් පෙනෙනා දියඇලි ගංගාවල් නොයෙකුත් වර්ණයන්ගෙන් සංකලනයක්වූ මල් වර්ග සැබවින්ම විස්තර කලනොහැකි තරම් අලංකාරයි.